
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 සැප්තැම්බර් 03 සඳුදා
04 වෙළුම - 45 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



## කන්‍යා මරියෝත්තමාවන්ගේ උත්පත්ති මංගල්‍යය සැප් 08 දා

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# කුඩා කිතුනු සංඝ පිළිබඳව පුංචි ඔබත් දැන ගත යුතුයි.

**ආදරණීය දුවේ පුතේ...**

අද අපි කථා කරන්න යන්නේ ශු. කතෝලික සභාව තුළ පුළුල්ව කථා කරන ඒ වගේම මීසම් ජීවිතය තුළ අනිවාර්යයෙන්ම මීසම් පවුල අත් විඳිය යුතු ප්‍රධාන ජීවිත අත් දැකීමක් පිළිබඳවයි. ඒ තමයි කුඩා කිතුනු සංඝ අත්දැකීම.

ආදර දුවේ පුතේ, මුළු මහත් විශ්ව සභාවේ කුඩා පරිමාණයේ අත්දැකීමක් හැටියට මේ කුඩා කිතුනු සංඝ හඳුන්වා දෙන්න පුළුවන්. අපි කුඩා කිතුනු සංඝ මේ විදිහට දැන ගන්නට උත්සාහ කරමු. කුඩා කිතුනු සංඝයක් කියන්නේ අසල් වැසි කිතුනු පිරිසකගේ එකමුතුවක්. සාමාන්‍ය යෙන් පවුල් 12 සිට 15 ක් දක්වා සංඛ්‍යාත්මක පිරිසක් මඟින් මෙය සමන්විත වෙනවා. ඒ වගේම තවත් වැදගත් කාරණාවක් හැටියට අප හඳුනා ගත යුත්තේ සතියකට හෝ දෙසතියකට වරක් හමුවන මේ එකමුතු පිරිස දේව වචනය තම ජීවිතයේ කේන්ද්‍රස්ථානය බවට පත් කර ගැනීමේ ක්‍රියාදමයයි. මෙය ඉතාම වටිනා අත්දැකීමක්. ශුද්ධවූ සුවිශේෂයේ කොටසක් කියවලා එය තමන්ගේ ජීවිත අත්දැකීමෙන් මෙනෙහි කරලා ඉන්පසුව සාමුහික යාච්ඤාවකට එකමුතු වෙනවා. ඒ වගේම තම ජීවිත අත්දැකීම් වල දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සහ ක්‍රියාකාරීත්වය හඳුනාගෙන එය එකිනෙකා සමඟ බෙදා ගනු ලබනවා. බලන්න කෙතරම් අපූරු ජීවිත අත්දැකීමක්ද කියලා

ආදර දුවේ පුතේ තවත් වැදගත් කාර්යයක් මේ කුඩා කිතුනු සංඝ තුළින් ඉටුවෙනවා. ඒ තමයි මේ සංඝයේ එකමුතු වන අය එකිනෙකා හඳුනාගනිමින් සහ එකිනෙකාට සහය වෙමින් එක්සත් භාවයක් ඇති කර ගැනීමට යොමුවීම. ඒ එකමුතුව ඉතාමත් ප්‍රබල ශක්තියක් බවට මුළු මීසම පුරාම පැතිරී යනවා. එය එලෙස පැතිරී යා යුතුයි. කුමකටද? ඒ එකතුවන අය කුඩා සංඝයන් ලෙස මීසමේ වැඩ කටයුතු වලට හවුල් වෙනවා. මීසමේ සංවර්ධනය සඳහා අවශ්‍ය උචිතතම පෞද්ගලික කුසලතාවන් පොදු මීසම් සංඝයේ සේවය සඳහා කැප කරනු ලබනවා. මේ හා සමගම ඒ එකමුතුවේ ප්‍රබලතාව විශාල ලෙස මීසම වෙනස් කරනවා වගේම මීසම් පවුල ශක්තිමත් කරන්නේ රසගන්වන ලවනයක් සේ ක්‍රියා කරමින් හා ජ්වලිත වෙමින්.

ආදර දුවේ පුතේ, පුංචි ඔබත් මේ මීසම් කුඩා කිතුනු සංඝ කොහොමද බල පවත්වන්නෙ කියලා නිවැරදිව හඳුනාගත යුතුය. මෙහිදී අපට ප්‍රධාන වශයෙන් කරුණු තුනක් කථා කරන්න පුළුවන්. අපි ඒවා මෙහෙම ගොනු කරමු. මේ කුඩා එකමුතු සංඝ,

1. දෙවියන් වහන්සේ සහ සංඝයේ අන් අය සමග ගැඹුරු සම්බන්ධතාවයක් ඇති කරනවා. පුද්ගලීකව දෙවියන් වහන්සේ හා සමීප සම්බන්ධතාවයක් ගොඩ නැගීම ආරම්භ කරනවා.
2. පුද්ගලයකු සේ ගොඩ නැගෙන්නට අභියෝග කරනවා. මේ එකමුතු අත්දැකීමෙන් තොරව ගැලවීම අත්විඳීමට නොහැකි බව පසක් කරනවා.
3. තම පවුලට , තම ඉගෙනීමට, තම කාර්යයන්ට, අසල් වාසීන්ට හා සංඝයට ඇති බැඳීම හා කැපවීම ගැඹුරු කරවනවා.

කතෝලික කුඩා දරුවෙක් හැටියට මේ කාර්යයන් තුළ හොඳ මනා හැදියාවක් ඔබ ලබනවා නම් වැඩිහිටියකු ලෙස අනාගතයේ ඔබෙ ජීවිතය කෙතරම් ප්‍රබල වෙනවාද? ලස්සන වෙනවාද? මේ සංඝ ප්‍රබල වෙනකොට මුළු මීසමම ශක්තිමත් වන්නේ පුදුමාකාර විදිහටයි. ඒ කොයි අයුරින්ද ?

1. මීසමේ වැසියෝ දේව වචනය අධ්‍යනය කිරීමට වැඩියෙන් උනන්දු වෙනවා. ධර්මෝපදේශයට හා ශ්‍රාවකත්වයට ඇති කැඳවීම ගැන හොඳ වගකීමක් භාර ගන්නට පෙළඹෙනවා.
2. මීසමේ වගකීම් කැමැත්තෙන් පවරා ගන්නවා. ගිහිදූත කාර්යයන් වල නියැලෙන්නට මහන්සි වෙනවා.
3. ධර්මදනීය දූත සේවාවේ සහ ඉන් ඔබ්බට විහිදුන දූත කාර්යයන් සඳහා යොමු වෙනවා.
4. මීසම භාර පියතුමා සහ මීසම් වාසීන් අතර සමීප සම්බන්ධතාවයක් ගොඩ නැගෙනවා. ඉරු දින දිව්‍ය පූජාවට නිරතුරුව සහභාගී නොවනඅය සමග පවා නව සම්බන්ධතාවයක් ආරම්භ වෙනවා.

ඉතිං දුවේ පුතේ, මේ කුඩා කිතුනු සංඝ වැඩිහිටියන්ට පමණක් අයිති දෙයක් නොවෙයි. පුංචි දරුවන් පවා මීසමේ කුඩා කිතුනු සංඝ සේ එකමුතු වෙලා ගොඩ නැගිම අද යුගයේ අවශ්‍ය තාවයක්. ඔබත් එයට සූදනම් නේද?

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# පෙරදිගින් බටහිරට ගොස් පෙරළා මෙහි පැමිණි කිතු දහම



## සිරිලක කිතුනු ඉතිහාසය

අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි

දිවයිනේ පැතිරගොස් ඇති ප්‍රධාන ආගම් හතරම පෙරදිග උපත ලද බව රහසක් නොවේ. බුදු දහම හා හින්දු ධර්මය භාරතයෙන් ආරම්භ වූ අතර කිතු දහම හා ඉස්ලාමය උපත ලද්දේ මැද පෙරදිගයි.

හින්දු ලබ්ධිය ප්‍රචාරය වූයේ වඩාත්ම හින්දු ලබ්ධිකයන් විවිධ රටවලට සංක්‍රමණය වීම හේතුකොටගෙන විනා හුදෙක් සංවිධානාත්මක ධර්ම ප්‍රචාරක ව්‍යාපෘතියක් නිසාම නොවේ. බුදු දහම මේ ක්ෂේත්‍රය තුළ වඩාත් සංවිධානාත්මක විය. මේ අනුව බටහිර ආසියාවේ අෆ්ගනිස්ථානය බාමියන්හි සිට ඈත පෙරදිග යපනයේ කමකුරාව දක්වා මුළු ආසියාකරය හරහා එය පැතිර ගියේ ය. මේ අනුව ආසියාකරය තුළ වඩාත් ම ප්‍රචලිත දහම බුදු දහමයි.

කිතු දහම මැද පෙරදිග උපත ලද නමුත් එසේ ම පර්සියාව , සීරියාව (අද ඉරාණය , ඉරාකය) ඉන්දියාව, චීනය ආදි දකුණු ආසියාතික රටවලට ද ක්‍රමයෙන් ගලා ආ නමුත් වඩාත් ශීඝ්‍රයෙන් ගලා ගියේ බටහිර යි. කිතු සමිඳුන් ගේ අග සව්වා හෙවත්, පේදුරු අපෝස්තුලුවරයා එවකට ප්‍රබල රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ රෝමයට සැපත් වීමත් සමග රෝම අධිරාජ්‍යයේ යටත් විජිත රටවල් වෙත ධර්මදූත ප්‍රයත්නයට ද වඩාත් යොමු විය.

මුල් සත වසර තුනක පමණ කාලයේ සභාව රෝමය තුළ දැඩි පීඩනයට ලක් වුවත් කොන්ස්ටන්ටයින් නමැති රෝම අධිරාජයා කිතු දහම වැළඳ ගැනීමත් සමග හෙවත් ක්‍රි.ව. 300 ඉකිබිති උදා වූයේ වසන්ත සමයෙකි. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ මුළු යුරෝපය ම කිතු දහම වැළඳ ගැනීම හෙවත් ''කතෝලික යුරෝපයක්'' බිහිවීම යි.

මෙසේ මේ මහාද්වීපයන්හි පිහිටි රටවල් අල්ලා ගත් යුරෝපීය ජාතීහු විශාල අධිරාජ්‍යයන් පිහිටා ගත්හ. මේ සමඟ ම තමන් යන රටවල කිතු දහම පැතිර වීම සඳහා ද පියවර ගත්හ. මෙම අවසාන පියවර කිතු දහමට සෙතක් වුවාට වඩා සිදුවූයේ අවාසියකි.

**කිතු දහම මැද පෙරදිග උපත ලද නමුත් එසේ ම පර්සියාව , සීරියාව (අද ඉරාණය , ඉරාකය) ඉන්දියාව, චීනය ආදි දකුණු ආසියාතික රටවලට ද ක්‍රමයෙන් ගලා ආ නමුත් වඩාත් ශීඝ්‍රයෙන් ගලා ගියේ බටහිර යි. කිතු සමිඳුන් ගේ අග සව්වා හෙවත්, පේදුරු අපෝස්තුලුවරයා එවකට ප්‍රබල රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ රෝමයට සැපත් වීමත් සමග රෝම අධිරාජ්‍යයේ යටත් විජිත රටවල් වෙත ධර්මදූත ප්‍රයත්නයට ද වඩාත් යොමු විය.**

මෙසේ සත වසර ගණනාවක් තුළ කිතු දහම වැළඳ සිටි යුරෝපීය ජාතීහු පසළොස් වැනි සතවසර පමණ වන විට කිතු දහම ආසියා , අප්‍රිකා , සහ අමරිකා මහාද්වීපයන් වෙත ගෙන යන්නට පටන් ගත්තේ ය. විද්‍යා දියුණුව හේතුවෙන් මුහුදු තරණය , ගමනා ගමනය පහසු වීම මෙන් ම යුද ආයුද ද බිහිවීම හේතුකොට ගෙන ඒ ඒ රටවල ඔවුන් සොයා ගියේ අරමුණු කිහිපයක් මුල්කොටගෙන යි. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ වෙළඳාම යි. දෙවැනිව තමන්ගේ එම ආර්ථික අරමුණ සපුරාලනු වස් බලය තර කැර ගැනීමයි. ඒ සඳහා පහසු ම මාර්ගය වූයේ ඒ රටවල් තමන් නතුකැර ගැනීම යි.

මෙම අරමුණු සංයෝගය නිසා අද දක්වාම කතෝලිකයෝ මේ රටවල විවේචනය කරනු ලබත්. කිතු දහම පෙරමුණු කොටගෙන මේ රටවල් කරා පැමිණි ජාතීන් අතර ප්‍රමුඛත්වය ගත්තේ පෘතුගාලය සහ ස්පාඤ්ඤය යි. මේ රටවල් දෙක කතෝලික රටවල් ය. රෙපරමාදු කිතු දහම රැගෙන පැමිණි රටවල් අතර ඕලන්දය පෙරමුණ ගත්තේ ය.


පෘතුගාලය සහ ස්පාඤ්ඤය විසින් මේ නව රටවල් සඳහා පූජාප්‍රසාදිවරුන් සපයා දීමේ ද නඩත්තු කිරීමේ ද වගකීම පවරා ගන්නා ලදී. පෘතුගීසි බසින් ''පඩ්‍රොආඩො'' නමින් හඳුන්වනු ලැබුවේ මේ වගකීම යි. මේ හේතුවෙන් මේ රටවලට සභාවේ පත්වීම් වැනි පාලන කටයුතු සඳහා ද විශේෂ වරප්‍රසාද හිමිවිය.

ක්‍රි.ව. 1637 දී ද ක්‍රි.ව. 1674 දී ද රෝමයේ ධර්ම ප්‍රචාරක කාර්යාංශය විසින් කරන ලද පත්වීම් දෙකක් හේතුවෙන් ගැටුම් ඇති විය. ක්‍රි.ව. 1681 සිට 1684 දක්වා ජුසේ වාස් පියතුමාට ද මෙම ගැටුමට මුහුණ දෙන්නට සිදුවිය.

මෙම ප්‍රශ්නය නිරාකරණය වූයේ ක්‍රි.ව. 1886 දී පෘතුගීසි රජයත් කතෝලික සභාවත් අතර අස්සන් තබන ලද ගිවිසුමක් අනුවය. ක්‍රි.ව. 1886 ජූනි 23 වැනි ද අස්සන් තබන ලද මෙම ගිවිසුම අනුව කතෝලික සභාවේ පාලන කටයුතු සියල්ල ශුද්ධෝත්තම පාප් වහන්සේ වෙත පැවැරිණි.

පෘතුගීසීන් සමග පැවැති මේ සම්බන්ධතාව ස්වල්ප වාසියක් වුවත් එහි ආදීනවය වඩාත් බරපතළය. අද දක්වා කතෝලික පිරිස වෙත චෝදනා එල්ල කරනු ලබන්නේ මෙය මුල්කරගෙන ය.

**කරුණාකර 14 පිටුව බලන්න.**



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

# ශු. ජේන් ප්‍රාන්සස් ද චාන්ටල්තුමිය

**ක්‍රි.ව. 1572 ජනවාරි 28 වන දින ප්‍රංශයේ ඩිජෝන් ප්‍රාන්තයේ උපත ලද එතුමිය කුඩා කල සිටම ශුද්ධවන්ත මෙන්ම ධාර්මික දිවියකට හුරු පුරුදු වී සිටියාය.**

කුඩා කල සිටම දෙව් මව් කෙරේ බැතිපෙම් දැක්වූ මෙතුමිය නිරන්තරයෙන්ම ඕතුමියගේ සළු සෙවනේ ආරක්ෂාවට බැඳී සිටියාය. සිය දිවි අරමුණ වූයේ තාපසිකාවක වීමටය.

නමුත් දෙමාපියන්ගේ බලවත් ඇවිටිල්ල හා බලකිරීම මත තරුණ ජේන් ප්‍රාන්සස් රාජ වංශික ධනවත් තරුණයකු හා විවාහ වූවාය. ඔවුන් දෙදෙනා ද ආදර්ශවත් අඹුසැමියන් ලෙස දිවිගෙ වූ නමුත් ඇගේ දරුවන් තිදෙනෙකු උපත ලද විගස මිය ගිය අතර, සිය සැමියා ඇයට සෑම අන්ද මින්ම ප්‍රියංකර නිවහනක් ඇති කළේය. ඇයට ඇගේ සැමියා බොහෝ ප්‍රේම කළ නමුත් සිය තරුණ වියේ දීම එනම් අවු. 28 දී සැමියා මිය ගිය පසු ඇයට දුක්ඛදායක කාලයකට මුහුණ දීමට සිදුවුවාය ඉන්පසු ඇගේ සහෝදරයන් හා මිතුරු මිතුරියන්ද ඇය දෙවන විවාහයක් කරගත යුතු බවට යෝජනා හා ඇවිටිලි කළ නමුත් නැවත විවාහයක් සිදු නොකරන බව ඇය තරයේම ප්‍රකාශ කර සිටියාය. මේ කාලයේ දී ශු. ෆ්‍රැන්සිස් සාලිස් මුනිඳුන්ගේ දේශනා මුළු ප්‍රංශය පුරාවටම රැව්පිළි රැව්දුන් අතර, දිනක් එතුමන්ගේ දේශනාවකට සවන් දුන් ජේන්ගේ හදවත තුළද නැවත දේව කැඳවීමේ බිජය රෝපණය වන්නට විය. ඇය තාපසිකාවක් වීම දේව කැමැත්ත බව ඇයට වැටහිණි.



ශු. ෆ්‍රැන්සිස් සාලෙස් මුනිඳුන්ගේ ආධාරය උපකාරය මත මරියාවන්ගේ බැහැදැකීමේ නිකාය ඇරඹූ අතර මෙම නිකාය සෙසු තාපස නිකායන්ගෙන් දිළිඳුකම හා සෞඛ්‍ය .... යනාදි හේතු මත අතහැර දැමූ සියල්ලන් උදෙසා දොරගුළු විවර වූ යැදුම් හලක් විය. මේ නිකාය තුළ යැදුම , පශ්චත්තාපික ක්‍රියාවන් , දරුවන්ගේ සුබසිද්ධිය හා අපෝස්තලික සේවාවන් සඳහා කැපවූ මෙම පැවිදි පංතිය , දයාවේ ක්‍රියාවන් උදෙසාද ඇප කැප වී සිටිති. සමාජයෙන් කොන් වූවන් අසරණ වූවන් උදෙසා සුබසෙත ඉටුකරමින්, දේවමාතාවන්ගේ සළුසෙවනේ ජපමාල බැතිය ව්‍යාප්ත කරන්නට ඕතුමිය නිරන්තරයෙන් තම අනුගාමිකයන් හට අවවාදඅනුශාසනා ලබා දුන් අතර දෙවිඳුන්ට ප්‍රිය ප්‍රසන්න ලෙස දිවි ගෙවා ක්‍රි.ව. 1641 දෙසැම්බර් 14 වන දින ස්වර්ගස්ථ වූවාය.

ඒ වන විට ඇගේ වයස අවු. 69 කි. ක්‍රි.ව. 1751 නොවැම්බර් 21 වන දින XIV වන බෙනදික් ශුද්ධෝත්තම පියතුමා මෙතුමිය භාග්‍යවරයට එසවූ අතර , ක්‍රි.ව. 1767 ජූලි 16 වන දින XIII වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා විසින් මෙතුමිය ශුද්ධවරයට ඔසවනු ලැබීය. ශු. සභාව තුළ වැන්දඹුවන්ගේ, කොන්කරනු ලැබුවන්ගේද අනාථ දරුවන්ගේ ද ආරක්ෂක මුනිවරිය ලෙස මෙතුමිය නම් කර ඇත.

**අසේල දසනායක**

### ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...

ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්ය මණ්ඩලය හා සිසු නායකයන්ගේද සේයාරූ සමග අප වෙත යොමු කරන්න.

අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,

අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# තල්විල මීසමේ ආධුනික ලේඛක ලේඛිකාවන්ට වැඩමුළුවක්



හලාවත පදවියට අයත් තල්විල මීසමේ දහම් ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා තල්විල සා. තෙරේසා දෙව් මැඳුරේදී පැවැත්වුණි.

මේ සඳහා තල්විල සා. තෙරේසා දහම් පාසලේ සහ මීට අයත් මෝදර වැල්ල ක්‍රිස්තුරාජ හා තල්විල වැල්ල ශා. අන්තෝනි දහම් පාසල් හි 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා ළමෝ සහභාගී වූහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක කුමර නයනජිත් මහතාය. ආධුනික ලේඛක ලේඛිකාවන් ලේඛන කලාව වෙත යොමු කරවීමේ අරමුණින් යුතුව තල්විල මීසම් සේවක ගරු නෙවිල් සෙබස්තියන් පියතුමාගේ අනුශාසකත්වයෙන් දහම් පාසල් හි ආචාර්ය මඬුල්ලේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිනි. මෙයට එක් වූ ගරු නෙවිල් සෙබස්තියන් පියතුමන් සහ කුමර නයනජිත් මහතා සේයා රුවෙහි වෙති.

**සටහන - චරිත් පීරිස් - සේයා - නිරංග පීරිස**

# ළමා අපචාර, ළමා හිංසනයට විරුද්ධව හඬක් නැගීමට වැඩිහිටියන් පෙරට ආ යුතුයි !

## ළ.ක්‍රි.වී. ජාතික අධ්‍යක්ෂ ගරු ජෝ.කුරේ පියතුමා





ශ්‍රී ලංකා ළමා ක්‍රියාකාරි විරයෝ (ළ.ක්‍රි.වී.) ව්‍යාපාරය සහ ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය එක්ව සංවිධානය කළ ළමා හිංසනය පිටුදැකීමේ පාගමනක් හා රැළියක් ඉහත තේමාව මුල්කරගනිමින් පසුගියදා පැවැත්විණි. කතෝලික හා ක්‍රිස්තියානි ආගමික නායක නායිකාවන් ඇතුලු විවිධ ජාති , ආගම් වලට අයත් ළමා වැඩිහිටි විශාල පිරිසක් ගුණසිංහපුර සිට බොරැල්ල ශු. ලුක් දේවස්ථානය දක්වා පාගමනින් පැමිණ එහිදී ළමා හිංසනය පිටුදැකීම පිළිබඳව මාධ්‍ය ප්‍රකාශනයක්ද නිකුත් කළහ. අද සමාජය තුළ සිදුවන ළමා අපචාර සහ ළමා හිංසනයට විරුද්ධව හඬක් නැගීම සහ එය දුරලීමට කටයුතු කිරීම සියලු වැඩිහිටියකුගේම වගකීම විය යුතු බව ළ.ක්‍රි.වි. ව්‍යාපාරයේ ජාතික අධ්‍යක්ෂ ගරු ජෝ. කුරේ නි.ම.නි.පියතුමා මෙහිදී ප්‍රකාශ කළේය.

**- එස්. පීවදේවී**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

## ජීවිතය විනාශ නොකරන්න

⋆ තම සහෝදරයා සමග තිබුණු සම්බන්ධය මෙන්ම දෙවියන් වහන්සේ සමග තිබූ සම්බන්ධය ද බිඳ දමා දෙවියන් වහන්සේට විරුද්ධව ශුද්ධ බයිබලයේ සඳහන් ප්‍රථම පාපය කුමක් ද? • කායින් ආබෙල්ව මැරීම

⋆ ජේසුස් වහන්සේට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වන්නෝ කවුරුහු ද?

• තමාගේ සහෝදරයාට ''මෝඩයා'' කියා ගරහන කවරකු වුව ද (මතෙව් 5/22)

⋆ ජේසුස් වහන්සේට අනුව අධිකරණයට යටත් වන්නෝ කවුරුහු ද?

• තමාගේ සහෝදරයා සමග කෝප වන කවරකු වුව ද (මතෙව් 5/22)

⋆ පස්වෙනි දේව පනතට අදාළව පාසල් පරිසරය තුළ ඔබට අනුගමනය කළ හැකි සාරධර්ම තුනක් ලියන්න. (සාමාන්‍ය පෙළ 2003/03/අ)

• පාසල් වත්තට එන කිසිම සතකුට හිරිහැර නොකිරීම • ජීවිතයට අනතුරුදායක මත්ද්‍රව්‍ය ආදිය සහ පැවතුම්වලින් වැළකීම

• පාසල් පරිසරය අලංකාර කිරීම සඳහා පාසල් වත්තේ වගා ව්‍යාපාරයක් ආරම්භ කිරීම

## කාමමිථ්‍යාචාරය නොකරන්න පරදාර ආලය නොකරන්න

⋆ හයවන දේව පනත කිමෙක් ද? • කාමමිථ්‍යාචාරය නොකරන්න (නික්මයාම 20/14)

⋆ නවවන දේව පනත කිමෙක් ද? • පරදාර ආලය නොකරන්න.

*''නුඹේ අසල්වැසියාගේ ගෘහයට නුඹ ඇළුම් නොකරව. තවද නුඹේ අසල්වැසියාගේ භාර්යාවට හෝ ඔහුගේ සේවකයාට හෝ සේවිකාවට හෝ ඔහුගේ ගවයාට හෝ කොටළුවාට හෝ නුඹේ අසල්වැසියා සතු වෙනත් කිසිවකට හෝ ඇළුම් නොකරව '' නික්මයාම 20/ 17)*

⋆ නවවන දේව පනත පිළිබඳව හිතෝපදේශය ග්‍රන්ථයෙහි සඳහන් වන්නේ කුමක් ද?

• ''පරදාර සේවනය කරන්නා අනුවණයෙකි. ඔහු තම ජීවිතය නාස්ති කරන්නෙකි'' (හිතෝපදේශය 6/32)

⋆ තම ජීවිතයේ පාරිශුද්ධභාවය රැකගත් සාන්තුවරියන් දෙදෙනෙක් නම් කරන්න.

• ශුද්ධවූ මරියා ගොරෙත්ති තුමිය • ශුද්ධ වූ ඇග්නස් තුමිය


⋆ ශුද්ධ වූ වස්තුවක් වූ මනුෂ්‍ය ශරීරය පිළිබඳව කිතුනුවාගේ වගකීම කුමක් ද?

• කිතුනුවාගේ ඇඳුම් විනීත විය යුතුය

• ස්වකීය ශරීරය පිළිබඳව ගෞරවනීය හැඟීමක් කිතුනුවා තුළ තිබිය යුතුය. • හැසිරීම සංවරශීලී විය යුතුය

• හැඟීම් වලට වහල්නොවී චරිත පාරිශුද්ධිය රැකගැනීමේ ආත්ම ශක්තියක් තිබිය යුතුය • කතාබහ යහපත් විය යුතුය

# ඔබ , ජේසු සමිඳුන් ලබා ගන්න සූදනම් ද ?



ආදර දුවේ, පුතේ දැන් ඔබ ඉගෙනුම ලබන්නේ පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන්නට සිටින හතර වෙනි පන්තියේ හෝ පස් වෙනි පන්තියේ විය හැකියි. මේ වසරේ කෙදිනක හෝ ඒ උතුම් ලස්සන දිනය ලඟා වනතුරු ඔබ ආශාවෙන් බලා ඉන්නවා පමණක් නොවෙයි, ඒ සඳහා, මාස ගණනක සිට, සූදනම් වෙනවා නේද?

ඉතිං ඔබට ඉතාමත් ප්‍රයෝජනවත් වන යාච්ඤා කීපයක් ඔබ පාඩම් කළ යුතුව තිබෙනවා. දිව්‍ය පූජා යාගයේදී පාපොච්චාරණය කිරීමේදී උදේ සවස යාච්ඤා කිරීමේදී ඒ යාච්ඤා ඔබට වැදගත් වෙනවා. ඒ වගේම මේ කාලය තුළ පාඩම් කරන යාච්ඤා ඔබේ ජීවිතයේ අනාගතයට , ශක්තියක් වන බව ඔබ දන්නවා ද?

ඒ වගේම යහපත් ගුණාංග ඔබ තුළ වර්ධනය කර ගැනීම අතීශයෙන් අවශ්‍ය වෙනවා. නැති බැරි අය වෙත අනු කම්පාව දයාව දක්වන පරිත්‍යාග ශිලි වන්න. කීකරුකම , ඉවසීම, බැහැපත්කම, ඔබට තිබෙනවා නම් ජේසුස් වහන්සේගේ ආදරය ඔබට නොඅඩුවම ලැබෙනවා. උන්වහන්සේ කළ යහපත් දේවල් වලින් බිඳක් හෝ ඔබට කරන්නට හැකිනම් ජේසු සමිඳුන්ගේ හොඳම මිතුරා වන්නට ඔබට හැකි වේවි. පුංචි පුංචි මර්ධන ක්‍රියා ඔබේ දිවියට හුරු කරගන්නා හැටි ඔබට දහම් ගුරුවරුන් කියා දෙන්න ඇති නේද? ළමා වියේදීම මර්දන ක්‍රියා කරන්න පුරුදු වීම ජීවිතය නිසි ලෙස ගොඩ නගා ගන්නට රුකුලක් වෙනවා. නිතරම ඔබ අතින් වරදක් නොවන්නට වග බලා ගන්න. ජේසු සමිදුන් ලබා ගන්නට ඔබ දැන් දක්වන පූර්ණ සූදනම සැමද ඔබ තුළ රඳවා ගන්නට වෙර දරන්න.

දැන් නම් ඇත්තටම ඔබ ලස්සනට පිපුන, සුවඳ හමන මලක් වගෙයි. දෙවිදුන් අසලම සිටින පුංචි දේව දූතයෙක් වගෙයි. හැමදම පල්ලි එනවා දහම් පාසල් එනවා. අත්දෙක වැඳගෙන යාච්ඤා කරනවා. මේ ඔබේ අපූරු හැඩ ගැසීම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන තුරු පමණක්ද?අනේ එහෙම නම් වෙන්න එපා දුවේ, පුතේ, හොඳද?

පළමු වරට ඔබේ පුංචි හද තුළට වැඩම කරන ජේසු සමිදුන්ව ආදරයෙන්, භක්තියෙන් හා ගෞරවයෙන් ලබා ගන්න උන් වහන්සේව සැමදම ඔබේ හදවතේ රඳවා ගන්න. ඔබේ පුංචි ලෝකය ලස්සන කරන්න. උන් වහන්සේට පුළුවනි, ජේසු සමිඳුන් ලබා ගන්න පළමු දිනය වාගේම හැමදමත් ගෞරවයෙන් හා භක්තියෙන් පූර්ණ සූදනමකින් උන්වහන්සේව ලබා ගන්න. උන්වහන්සේ ඔබ තුළට වැඩම කිරීම ගැන ස්තුති කරන්න. ඔබේ අවශ්‍යතාවයන් උන්වහන්සේට කියන්න.

ඔබ උන්වන්සේ සමඟ කථා කරනවාට උන් වහන්සේ අතීශයෙන් කැමතියි. උන්වහන්සේ ඔබට ඇහුම්කන් දී ඔබේ ඕනැකම් ඔබට යහපතක් නම් හොඳාකාරවම ඉටු කර දෙනවා. ඔබේ ආදරය උන් වහන්සේට දෙන විට, උන්වහන්සේගේ අපරිමිත ආදරය ඔබ වෙත ගලා එනවා. එවිට ඔබ ජේසු සමිඳුන්ගේ සුරතේ රැඳී සිටින හොඳම මිතුරා වෙනවා.

ඉන්ද්‍රාණි ප්‍රනාන්දු
දියලගොඩ

# පල්ලන්චේන දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්



දළුපත සිද්ධස්ථානයට අයත් පල්ලන්චේන ආරෝග්‍ය දේව මාතා දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා ආරෝග්‍ය දේවමාතා දෙව්මැදුරේදී පැවැත්වුණි. මෙම වැඩමුළුව මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින්ය. මෙය දහම් පාසලේ 8 ශ්‍රේණියේ සිට ඉහල ළමුන් සඳහා පැවැත්වුණි.

මේ සඳහා සහභාගී වු ළමුන්ට පුවත්පත්කලාව , ජන සන්නිවේදනය හා නිර්මාණකරණය පිළිබඳව දැනුවත් කළ අතර ලේඛක අභ්‍යාසයක්ද ලබා දුනි. මෙහි සාර්ථක නිර්මාණ ළමා ප්‍රදීපයෙහි පළ කිරීමට කටයුතු යෙදීම ළමුන්ට ලැබුණු මහඟු අවස්ථාවකි. දළුපත සිද්ධස්ථාන පාලක ගරු ක්‍රිස්ටෝපර් ජුලියස් පියතුමන් ගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරිනි. දේශක මහතා පුවත්පත් කලාව පිළිබඳව ළමුන්ව දැනුවත් කළ අයුරු සේයා රුවෙහි දිස්වේ. **මෙත්මාල් රෝසා**

**භාග්‍යවත් දේව මාතාවන් වෙත බැති පුද සැලකිලි දැක්වීමේ ඉතිහාසය විශ්ව කතෝලික සභාව තරම්ම ඉපැරණි වන අතර එය ලෝකය පුරා ව්‍යාප්තවී තිබේ. මේ නිසාම මරිය බැතිය ලෙස ලොව පුරා ප්‍රකටව හා පතළව පවත්නා දේව මාතාවන් කෙරේ පුදන බැතිහරසර ඇතැම් අන් කිතුනු නිකායිකයකු හෝ මූලධර්මවාදියකු වැරැද්දක් ලෙස දකින, එසේ පවසන වකවානුවක වෙසෙනා පුංචි ඔබටත් ඒවා ඇසී ඇතිවාට සැක නැත.**


# අම්මා පුදන්නයි දරු අප යන්නේ

ලෝකයේ ඉදිවී ඇති දෙව් මැදුරු වලින් වැඩි ප්‍රමාණයක් දේව මාතාවන්ට කැපකර තිබේ. ලූර්දු පාතිමා ඇතුලු දේව මාතා දර්ශනයන් ගණනාවකි. ඉන් සමහරක් ශුද්ධාසනයේ නිළ පිළිගැනීමට ලක්ව නැතත් ජනතාවගේ බැති පුද හරසර එසේ කියා අඩුවී නැත. මේ ලෝකයේ විසූ හෝ දැනට වසන එක් තැනැත්තකු වැඩිම නම් ගණනකින් හඳුන්වනු ලබන්නේ කවුදැයි කියා විමසුවහොත් ඒ අන් කවරකුවත් නොව දේව මාතාවන් බැව් නිසැකව පිළිගැනෙන්නේ එතුමිය වෙනුවෙන් ඇති නම් සිය ගණනාව පමණක් සිහිපත් වීමෙනි. එමෙන්ම ගෙවීගිය ක්‍රිස්තු වර්ෂ දෙදහස තුළ දේව මාතාවන් අවස්ථා ගණනාවක යළි යළිත් දර්ශනය වෙමින් පාපයේ බියකරු බවත් සාමයේ මහිමයත් ලෝකයාට කියා දෙමින් දේව අණසකට නතුව දිවි ගෙවීමේ අගය ප්‍රකාශ කර තිබේ. මේ බොහොමයක් කරුණු කාරණා වලින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට දේවත්වයෙන් මනුෂ්‍යත්වය ලබා ගැනීමේ ඒ මහා



**මරියතුමිය උපන් අවස්ථාව**

මාංශගත වීමේ ක්‍රියා වලියට උරදුන් කන්‍යා මරිය මාතාවන් එද සිට මිනිස් වගයේ දයාබර මාතාව ලෙස නිරන්තරයෙන් පිහිට වන්නට සැදී පැහැදී සිටින අන්දම අපූරුවට දිස්වේ. මේ බැව් කදිමට සනාථ කරමින් ලෝකය පුරා මහා සිද්ධස්ථානයන් එතුමියගේ නාමයෙන් නැගී සිටිති. එපමණකුදු නොව, ජපමාල ධ්‍යානය මගින් අපි නිරන්තරයෙන් දේව මාතාවන්ගේ මධ්‍යස්ථකමින් ස්වාමීන් වහන්සේ නමදිමු.



මේ උදවන්නේ සැප්තැම්බර් මාසයයි. සැප්තැම්බර් 08 වෙනිදට මරිය මාතාවන්ගේ ජන්ම දිනය යෙදී තිබේ. ලෝ පුරා කිතුනුවෝ එතුමියට එදින හරසර දක්වති. එතුමියගේ මැදිහත් කම පතා යාච්ඤා කරති. සිරිලක කිතුනු ඉතිහාසය පිරික්සා බලන කල මරිය බැතිය අතීතයේ පටන් මහත් අභිමානයෙන් පැවති අයුරු දිස්වේ. මෙරට කිතු දහම ප්‍රතිස්ථාපනයේ පුරෝගාමියාණන්වූ භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා දේව මාතාවන්ට මහත් භක්තියක් දැක්වූයේය.

සිය උපන් ගමවූ සංකෝලේ ආරෝග්‍යමාතා දෙව්මැදුරේ දී 1677 අගෝස්තු 05 වැනිදු ලිඛිත ලියවිල්ලක් මගින් ජුසේ වාස් පියතුමා දේව මාතාවන්ට තමාව කැප කරයි.

ජෝශප් වාස් පියතුමා වන මම අති භාග්‍යවත් කන්‍යාවවූ දේවමාතාවගේ වහලකු වශයෙන් සිය නිදහස් කැමැත්තෙන් අංග සම්පූර්ණ අවලංගු කළ නොහැකි මේ ත්‍යාග ඔප්පුව මගින් මා සතු සියල්ලක් පිළිබඳව කැමතිසේ ක්‍රියා කළ හැකි වන පරිදි ඇයට කැප කරමි. මා මේ ගෞරවයට නුසුදුස්සකු බව දන්නා හෙයින් මගේ රැකවල් දේව දූතයා හා මේ බිසොවගේ ස්වාමිපුත්‍රයාත්,



මගේ අරක්ගත් මුනිවරයාත්වූ ප්‍රතාපවත් ආදි පිතෘ ශුද්ධවූ ජුසේ තුමාත් සියලු ස්වර්ගීය වැසියනුත් ඇය විසින් ඇයගේ වහල් ගණයා කෙරෙහි ලා මා පිළිගන්නා ලෙස වරම් ලබා දෙන මෙන් ඉල්ලමි. මෙය අවලංගු කළ නොහැකි සැබෑ ලියවිල්ලක් වශයෙන් මගේ නම මෙහි පිහිටුවමි. මම මෙහි මගේ හෘදයේ ලෙයින් අත්සන් තැබීමට කැමති වෙමි. ජෝශප් වාස්. දේව මාතාවන්ට තමාව වහලකු ලෙස පවරාදුන් ජුසේ වාස් පියතුමා මහනුවර තැනූ ප්‍රථම දෙව්මැදුර මිථ්‍යා දෘෂ්ටින්ගේ සිත් හැරීම උදෙසා අප ස්වාමිදුවට කැප කළේය. මාංතොට, පේසාලේ පුත්තලමේ මෙන්ම මීගමුවේද දේව මාතාවන්ට කැපවූ දේවස්ථාන රැසක් විය. ඒ සැමෙකක් මගින් ඉතාමත් පැහැදිලි වුයේ මෙරට ජනතාව තුළ දේව මාතාවන් කෙරේ පතළව තිබූ මහත්වූ භක්තියයි.

මේ අතර දේව මාතාවන් උදෙසා කතෝලික සමිති සමාගම් රාශියක් ආරම්භ විය. උතුරු නැගෙනහිර ඇතුලු රට පුරා ඇරැඹි මේ සමිති සමාගම් අතර මරිය සේනාව හෙවත් මරිය හමුදව මුල්තැන්හිලා ගිනිය හැකිය. මේ ආගමික සමිති සමාගම් දේව ජනතාවගේ ආධ්‍යාත්මික වර්ධනය ඉලක්ක කරගෙන පැවැත්විය . එමෙන්ම 1866 දී ඇරැඹි ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත, 1869 කැතලික් මැසෙන්ජර් හා 1876 ඇරැඹි පාදුවාවලින් ආදී පුවත්පත් ද භක්ති ප්‍රබෝධනය, දිව්‍ය හෘදයේ දූතයා ආදි සඟරාද මෙරට මරිය බැතිය ප්‍රචාරය සඳහා මහත්වූ සේවාවක් ඉෂ්ට සිද්ධ කිරීමට ඇප කැපවූ බැව් පැවසීම අතිශයෝක්තියක් නොවේ. මෙපමණක් නොව ශ්‍රී ලංකාවේ මරිය මාතාවන් වෙනුවෙන් ලියැවුණු සුවිශේෂී සාහිත්‍යයක්ද වේ. සිරිලක මරිය සාහිත්‍යය ලෙස ඇගයීමට ලක් කළ හැකි මෙහි පුරෝගාමියා ලෙස පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා දැක්වේ. පසුකලෙක ප්‍රැන්සිකාන නිකාය, නිර්මල මරිය නිකාය, බෙනදිකාන නිකාය මගින් මේ සාහිත්‍යය පෝෂණයට මහත් මෙහෙවරක් ඉටු කළේය. අලගියවන්න මුකවෙටි පඬිතුමන්ගේ නිර්මාණ සාහිත්‍යයේද මරිය බැතිය දක්නට ලැබු අතර ඔහුගේ කුස්තන්තීනු හටන ඊට කදිම නිදසුනකි. එහි ආරම්භයේදීම කතුවරයා සිය ආගම පසසමින් දෙව්මවුන්ට තුති ගී ගයයි. මේ ආදි වශයෙන් දේව මාතාවන්ට ගරු බුහුමන් පුදන්නට අතීතයේ සිට සිරිලක කතෝලිකයෝ සැදී පැහැදී සිටියහ.

මේ අතීත පුරසාරම් වලින් පමණක් උද්දමයට පත්නොවී වර්තමාන සමාජය තුළ මරිය බැතිය ජීවමාන කරන්නට දූ දරු ඔබටත් වගකීමක් තිබේ.

දිනපතා ජපමාලය උච්චාරණය කරන්නට පුංචි ඔබට හැකිනම් එය ඉතා වටිනා දෙයකි. පවුලේ ජපමාල භක්තිය පැල දොරින් පළාගොස් ඇති බවට මැසිවිලි නැගෙන මේ සමයේ සෑම සන්ධ්‍යාවකදීම අම්මා - තාත්තා හා සහෝදර සහෝදරියන් එක්කර ගනිමින් පවුල් ජපමාලයට යළි පණ පොවන්නට දුලා පුතාලා උත්සාහ ගත්තොත් එය අපේ වැඩිහිටි දෙමාපිය කොයි කාගෙත් දෙනෙත් අරින්නක් වේවි නේද? උපන් දිනයට පුදන තිළිණයක් ලෙස පුංචි ඔබ දේවමාතාවන්ට මේ තෑගි පුද කරන්නේනම් දේව අම්මා මොන තරම් සතුටු වේවිද දුවේ පුතේ,



**මරියතුමිය තම මව වූ ශු. ආනා තුමිය හා පියා වූ ශු. ජුවකීනු තුමා සමඟ..**

**ශිරාන් මෛත්‍රී**

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි. පාඩම් අංක : 68

## Positive - Comparative - Superlative
## පිළිබඳ තවදුරටත්

ඊළගට අපි තවත් මතක තබාගත යුතු කරුණක් තියනවා. **සමහර කෙටි වචන වල අවසාන අකුරට කලින් අකුර වචල් අකුරක් නම් ඒ වචන වල comparative සහ superlative වලදී ඒ අවසාන අකුර දෙවරක් යෙදෙනවා.** මේ අකුරු පිළිබඳව (spellings) ඔබ දැනුවත් විය යුතුය.

නිදසුන් වශයෙන් අපි fat කියන වචනෙ ගනිමු. එකේ අවසාන අකුර 't'.

ඊට කලින් යෙදාල තියෙන්නෙ. 'a'. ඒක වචල් අකුරක්. ඒ නිසා ඒ fat කියන කෙටි වචනය comparative කරද්දී 't' අකුර දෙවරක් යොදෙනවා. fa**tt**er යනුවෙන්. ඒ වගේම superlative වෙද්දීත් 't' අකුර දෙවරක් යෙදෙනවා fa**tt**est යනුවෙන්. ඔබට පැහැදිලියි නේද?

එවැනි තව වචන කීපයක් පහතින් සඳහන් කරන්නම්. ඒවා ප්‍රවේශමෙන් අධ්‍යනය කර භාවිතා කිරීමේදී අකුරු ගැන (spellings ගැන) ප්‍රවේසම් වන්න.

| | | |
|---|---|---|
| fat (තර) | fatter (වඩා තර) | fattest (වඩාත්ම තර) |
| hot (රස්නෙ) | hotter (වඩා රස්නෙ) | hottest (වඩාත්ම රස්නෙ) |
| red (රතු) | redder (වඩා රතු) | reddest (තදම රතු) |
| wet (තෙත) | wetter (වඩා තෙත) | wetterst (වඩාත්ම තෙත) |
| glad (සතුටු) | gladder (වඩා සතුටු) | gladdest (වඩාත්ම සතුටු) |
| thin (කෙට්ටු) | thinner (වඩා කෙට්ටු) | thinnest (කෙට්ටුම) |
| sad (දුක්බර) | sadder (වඩා දුක්බර) | saddest (දුක්බරම) |

ඉහත වචන වල අවසාන අකුරට පෙර ඇත්තේ වචල් වචනයක් නිසා අවසාන අකුර දෙවරක් යෙදිලා තියෙන හැටි නිරීක්ෂණය කර අවබෝධ කරගන්න.

**ඊළගට y අකුරකින් අවසාන වන සහ ඊට ඉදිරියෙන් වචල් එකක් නොවන අකුරක් (Consonant) යෙදෙනෙව නම් ඒ වචනය Comparative හෝ Superlative බවට පත් කිරීමේදී y අකුර වෙනුවට 'I' අකුර එකතු කර ඉන්පසු er සහ est යෙදෙන බව මතක තබාගන්න.**

**නිදසුන්:-**

dry - drier (Y ඉවත් කර er යොදා) driest (Y ඉවත්කර est යොදා)

| | | |
|---|---|---|
| early (කලින්) | earlier (වඩා කලින්) | earliest (වඩාත්ම කලින්) |
| happy (සතුටු) | happier (වඩා සතුටු) | happiest (වඩාත්ම සතුටු) |
| heavy (බර) | heavier (වඩා බර) | heaviest (වඩාත්ම බර) |
| merry (ප්‍රීතිමත්) | merrier (වඩා ප්‍රීතිමත්) | merriest (වඩාත්ම ප්‍රීතිමත්) |

ඊළගට අපිට තවත් එක ක්‍රමයක් ඉගෙන ගන්න තියෙනවා. **මෙහෙම සංසන්දන කිරීමට භාවිතා කරන සමහර වචන සඳහා Comparative සහ Superlative වලදී සම්පූර්ණයෙන් එකට එකක් වෙනස් වූ වචන භාවිතා වෙන අවස්ථාවන් තියෙනවා.**

නිදසුන් :-

Good කියන වචනය ගනිමු. ඒකට good-gooder- goodest යනුවෙන් යෙදෙන්නේ නැහැ. ඒ වගේම bad-badder- baddest කියලා යෙදෙන්නේ නැහැ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.
ඒවා යෙදෙන්නේ මෙහෙමයි.

good - better - best

bad - worse - worst මෙවැනි තවත් වචන කීපයක් පහතින් දැක්වෙනවා.

| Positive | Comparative | Superlative |
|---|---|---|
| well (හොඳ) | better (වඩා හොඳ) | best (හොඳම) |
| ill (අසනීප/නරකතත්වයක) | worse (වඩානරකතත්වයක) | worst (වඩාත්ම නරකතත්වයක) |
| many (විශාල සංඛ්‍යාවක්) | more (ඊට වැඩි සංඛ්‍යාවක්) | most (විශාලතම සංඛ්‍යාවක) (ගණින් කළ හැකි දේවල්) |
| much (බොහෝ ප්‍රමාණයක්) | more (ඊට වැඩි ප්‍රමාණයක්) | most (වැඩිම ප්‍රමාණය) (ගණින් කළ නොහැකි දේවල්) |
| far (දුර) | farther (වඩා දුර) | fartherst (වඩාත්ම දුර) |





**දේව අම්මා**
**නවංජිනා සත්සරණි**
11 ශ්‍රේණිය
සාන්ත ආනා දහම් පාසල
වලහපිටිය
(නාත්තන්ඩිය මීසම)

**16 වන බෙනඩික්**
**ශුද්ධෝත්තම පියතුමා**
**රුක්ෂාන් අරෝෂන්**
12 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල
මුන්නක්කරය
මහාවීදිය මීසම



**ශ්‍රී ශරීරය හා රුධිරය**
**රුමාල් හිමාෂ ප්‍රනාන්දු**
**11** ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
නයිනමඩම




**දේව මැව්ල්ලේ අසිරිය**
**හෂිශානි ඒන්ජල්**
08 ශ්‍රේණිය
ආරෝග්‍ය මාතා දහම් පාසල
පල්ලන්චේන,
(දළුපත මීසම් )

**දිව්‍ය හෘදයේ ජේසු**
**නිමේෂ් සදීෂ**
09 ශ්‍රේණිය
ක්‍රිස්තුරාජ දහම් පාසල
මෝදර වැල්ල
(තල්විල මීසම)





**මෝසෙස් තුමා**
**අනුෂ්ක නිර්මාල් ප්‍රනාන්දු**
08 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
කටුකුරුන්ද , මොරටුව

# මරිමව්නි

**දේව වචනයට අවනත වී ඔබ**
**දෙවි පිය තුමදුන් අණ**
**එහෙයි කියා ඔබ පිළිගත්තා**
**ජේසුගේ මව වූ ආදර අම්මේ**
**අපිත් ඔබේ දරුවෝ**

**ළදුන් අතරෙ මිණි පහනක් වී**
**ජේසුපුතා ඇතිදැඩි කෙරුවා**
**කීකරු වූ ඔහු ලෝකෙම ගලවා**
**අපේ ගමන් මඟ එළි කෙරුවා**

**ශුද්ධවන්ත වූ මරිමව්නි**
**සදා වඳිමු අපි නමෝ නමෝ**
**දෙන්න අපට ඔබේ වරම් මෙදා**
**කියා දෙන්න දෙවි ප්‍රේමේ සදා**



**සචිනි සෞම්‍යා කුමාරි**
**8 ශ්‍රේණිය**
**සදාසරණ දේවමාතා දහම් පාසල - පදවිය**

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 32, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**



**ශු. මිඛායෙල් අග්‍රදූත මුනිතුමා**
**නිර්මාල් රොෂාන්ත පෙරේරා**
03 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව

**සුරැකි පියා**
**කවිෂ්ක ලක්ෂාන් පෙරේරා**
06 ශ්‍රේණිය
සාන්ත ආනා දහම් පාසල
බොරලැස්ස





**ශු. නිකුලා මුනිතුමා**
**ඩිලාන් ඩිග්මන්**
06 ශ්‍රේණිය
සාන්ත ජූඩ් විදුහල - කුරණ

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**සාන්ත සෙබස්තියන් මුනිතුමා**
**ප්‍රමෝද්‍ය හේෂාන්**
03 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
කිරිමැටියාගාර

**ශුද්ධවු විනිප්‍රිඩා මුනිවරිය**
**ක්‍රිශාන්ත ලක්මාල්**
08 ශ්‍රේණිය
ශුද්ධවු විනිප්‍රිඩා දහම් පාසල
කහටවිල (හාල්දඩුවන මීසම )



**ශු. අන්තෝනි මුනිතුමා**
**පියුමිකා දිනුක්ෂි**
07 ශ්‍රේණිය
සාන්ත ජෝශප් විදුහල
කඩොල්කැලේ
(මීගමුව ශාඛාව )






# තරාතිරම නොබලා අන් අයට උදව් කරමු

**ආදරණීය දුවේ , පුතේ,**

**පසුගිය ලිපිය තුළින් මා ඔබට මතක් කළා කුමන වෘත්තියක යෙදුනත් සෑම පුද්ගලයකුටම ගරු කළ යුතු බව. එහෙත් මොහොතකට හිතන්න. වත ගොත, පෙළ පත, උගත්කමවත් , පොහොසත්කම , රැකියාව , රූපය හැඩය වර්ණය, කුමක් වුවත් අපිට පුළුවන් ද එක වගේ සළකන්න. අද සමාජය බොහෝ විට හුරු පුරුදු වී සිටින්නේ මිනිසුන්ගේ තරාතිරම බලල සලකන්න. බොහෝ වෙලාවට දුක් විඳින වැඩ කරන මිනිසුන්ට කිසි පිළිගැනීමක් සැලකිල්ලක් නැති අවස්ථා කොයිතරම් තියනවාද?.**



එහෙත් අපි කොයි තරම් ඉගෙන ගෙන තිබුනත් අපි කොයි තරම් නිලතල නම්බු නාම දැරුවත් අපි අතින් මිනිසුන්ගේ හිත් රිදවන වැඩ සිද්ධ වෙනවා නම් ඒවා ජේසුට නම් ප්‍රසන්න නැති වේවි.

යම් පුද්ගලයෙක් නිවසකට හෝ ආයතනයකට ගියහොත් ඒ පුද්ගලයාගේ අවශ්‍යතාවන් පිළිබඳව සලකනවාද? සංවේදීව ක්‍රියා කරනවාද ඔහු හෝ ඇය ඇඩි ලෙස පීඩාවට විඩාවට පත්ව සිටී නම් , පීඩාව සමනය කර විඩාව සංසිඳවීමට ක්‍රියා කරනවාද?. කෙසේ වෙතත් බොහෝ විට තේ කෝප්පයක් හෝ ආහාර වේලක් පිළිගැන්වීමේදී පවා තමන්ගේ පංතියට අයිතිද? තමන්ගේ හොඳම මිතුරෙක්ද මිතුරියක්ද? තමන්ට වාසි සහ ප්‍රයෝජන ලබා ගත හැකිද? එසේත් නැතහොත් වාසි , ප්‍රයෝජන , වරප්‍රසාද ලබා ගැනීමට මාර්ග යක් සලසා ගත හැකිද යන කරුණු කාරනා සලකා බලනවා. එසේත් නැතහොත් බොරු කාර්ය බහුලත්වයක් මවා ගෙන උදව් කිරීමට අවස්ථාව තිබියදීත් අදාළ අවස්ථාවෙන් පලා යනවා. ඒත් ජේසු නම් කියන්නේ ''තමාට මෙන් ම අසල් වැසියාට ප්‍රේම කළ යුතු බව'' මෙබඳු අවස්ථා වලදී ජේසුගේ වදන් අමතක කර ක්‍රියා කිරීම නම් එතරම් හොඳ නෑ.

ආදරණීය දුවේ පුතේ, කුඩා කල සිටම ඔබත් ඔබට වගේම අන් අයටද තරාතිරම නොබලා ප්‍රේම කිරීමට පුරුදු පුහුණු වන්නේ නම් මේ සමාජය කොයිතරම් සොඳුරු තැනක් බවට පත් කර ගත හැකිද?

**ජී.ඒ. නිමාලි ප්‍රනාන්දු**
**ගුරු මව**



සේයා :- ශ්‍රියංගනී ෆිලීෂියා


## මාසික සිතිවිල්ල

"අගෝස්තු මාසය"

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# ප්‍රහේලිකා අංක 32



( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

හරහට

1. මෙම කාලයේදී විශේෂයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහි කරනු ලබයි.

4. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් උන්වහන්සේ ප්‍රේම කළ තැනැත්තා උන්වහන්සේගේ .......... ළංව හාංසි වී සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැඟී සිටි අයට සුවය ලබාදුන් සේක.

8. ක්‍රිස්තුන් තම කන්ද උඩ දේශනයේදී ........... හා විපත පිළිබඳව විස්තර කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

9. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් ජුදස් පොදු ............ පසුම්බිය බාරව සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනයට සමාන වචනයකි.

පහළට

1. අල්ලස් ගැනීමෙන් මෙය දූෂණය වන බව ධර්ම දේශකයා පවසයි.

2. ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණ ගසන පිණිස ........... පිටිය යන අර්ථය ඇති ''ගොල්ගොතා'' නම් ස්ථානයට ගෙන ගිය සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසු පසු මද්දහනේ සිට අපරභාග ............... පමණ උන්වහන්සේ ''මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?'' කියා මොර ගැසුහ. මෙහි හිසතැනට සුදුසු වචනය

5. එක් ධනවත් ප්‍රධානියෙක්, උන්වහන්සේට කථා කොට, ''............. ගුරු දේවයනි, සදාතන ජීවිතය උරුම කර ගන්නට මා කුමක් කළ යුතුදැ''යි ඇසිය. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෙරමියා දිවැසිවරයාට දෙවියන් වහන්සේ මෙසේ වදාළ සේක. ''ඊශ්‍රායෙල් ජනයෙනි, .......................... කරු අතේ තිබෙන මැටි පිඩක් මෙන් නුඹලා මාගේ අතේ සිටින්නාහුය. හිස් තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මාක් 15/22, , ශු. ලූක් 6/ 20 , 18/18 , ශු. ජුවාම් 13/ 23 , 13 / 29 , ජෙරමියා 18 /6 , ධර්මදේශකයා 7 / 7)

03 පිටුවෙහි ඉතිරිය

## පෙරදිගින් බටහිරට ගොස් පෙරළා මෙහි පැමිණි කිතු දහම

පෘතුගීසී පාලනයට නතුවුයේ අප රටේ කොටසක් හෙවත් මුහුදුබඩ පළාත් පමණකි. එහිදි සියලු පළාත් නොවේ. පෘතුගීසීනට රට පාවා දීම සඳහා මඟ පැහැදුනේ අප ගේම රජ වරුන්ගේ අසමගිය නිසායි. මේ ගැන පැහැදිලිව අප රාජාවලියේ පවා සටහන් වී ඇත. ඒ මෙසේය ''ප්‍රතිකානුන් එක්ක අත්වැල් බැඳ අනුවණකම් කළ බුවෙනකබාහු රජතුමා ඇතිකළ කුමාරයින් ප්‍රතිකාල් රජුට භාරකර දී අනුවණකම් කළ කමින් ඒ රජුට ප්‍රතිකානෝ හදි කළයි මතු සිරිලකට උපදිනා සතහට අනදරවල් ඒ බුවනෙකබාහු රජු විසින් පමුණුතැයි දැනගත යුතුයි. මතු බුද්ධ ශාසනයට අනාදරවල් ඒ රජ නිසා පැමුණුනයි දැනගත යුතුයි'' (රාජාවලිය - ඒ.වී සුරවීර - ප්‍රථම මුද්‍රණය 1976 , 219 පිටුව)

ඒ එසේ වුවත් අද දක්වාම චෝදනා එල්ල වන්නේ කතෝලික ප්‍රජාවටමයි. පෘතුගීසීන් ද කළ වැරදි සාතන , කුරිරු ක්‍රියා අපි ද හෙළා දකිමු. එහෙත් ඒ සියල්ල අමිල වු නිමල කිතු දහම වෙත පැටවීම සාධාරණ නොවේ. ඒ හැරත් ඕලන්ද පීඩනයෙන් බැට කා පවිත්‍ර වෙමින් සිටි මෙරට කතෝලික පිරිසට භාරතයෙන් වැඩම කොට, දෙපා වාරුවෙන් ගමන්කොට, පුනර්ජීවනයක් ලබාදුන් බ්‍රහ්මණ ගෝත්‍රික ජුසේ වාස් පියතුමන්ගෙන් ඉක්බිති රට , දැය වෙනුවෙන් ඉටු කරති අසමසම දයකත්වය ගැන ද දැනුවත් වීම අප සියලු දෙනාගේ ම යහපතට හේතුවනු ඇතැයි නොකියා සිටිය නොහැකිය.

මේ ගැන විශේෂයෙන් අප කතෝලික ගිහි පැවිදි පිරිස දැනුවත් වීම ඉතා වැදගත් ය.

## ප්‍රහේලිකාව පුරවා එවීමේදී

- ප්‍රහේලිකා පුරවා එවීමේදී ඔබගේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, ඉගෙනුම ලබන ශ්‍රේණිය හා දුරකතන අංකයද පැහැදිලිව ලියා අප වෙත යොමු කරන්න.
- එක් අයෙකුට ප්‍රහේලිකා පුරවා එවිය හැක්කේ 2 ක් පමණක් බැව් කරුණාවෙන් සලකන්න.
- ඔබ පුරවා එවන ප්‍රහේලිකාව තැපැල් පතක අලවා එවීමද **අනිවාර්ය** බැව් සලකන්න.

**සංස්කාරක පියතුමා**


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
කථාව :- ආනන්ද කාලුදේරා
දෙවස් චිත්‍ර :- ඇස්. ඒ. පී. සපුආරච්චි
13
ඒක දැකපු කුමාරි කෑගහගහ අඬන්න ගත්තා..
අනේ මගෙ කුමාරයව කොහොම හරි බේරල දෙන්න..
හරි මම ඔයාට උදව් කරන්නම් හැබැයි මේ ගැන කාටවත්ම දැනගන්න තියන්න එපා.!
මායා කැඩපත... අපි දෙන්නාව ඉක්මනින්ම කුමාරයා සිටින තැනට රැගෙන යන්න..
වැඩි වේලාවක් ගතවුනේ නැහැ.. ඒ දෙන්න කුමාරයා සිටින අසලටම පැමිණියා.! කුමාරයා සිහිය නැතිව නැවේ කොටයක් උඩ පාවෙමින් සිටියා..!
දෙන්නම එකතුවෙලා බොහොම අමාරුවෙන් ළඟම තිබුන ගල් පරයක් ඇතුලෙ තිබුන ගුහාවකට කුමාරයව අරගෙන ගියා..!
කුමාරයව ගල් තලාව උඩින් තියමු...
මායා කාරියගෙ දුව එයාගෙ ඇඟිල්ලෙ තියෙන මුද්ද පිම්බැදලම ඒක දිහා බලාගෙන මන්ත්‍රයක් මැතිරුවා..!
पतथर चरका मनदिर दे मनदिर दे..
ගල් ගුහාව පුංචි මාළිගයක් වේවා..
එක පාරටම ගල් ගුහාව ඇතුල ආලෝකමත් වුනා ටිකෙන් ටික ගල් ගුහාව පුංචි මාළිගයක් වුනා.! ඇඳ පුටු මේස වාගෙ දේවල් මැවුනා.. කෑම බීම වලින් මේස පිරුනා.. පුංචි මාළිගාවෙ කිසිම දේකින් අඩුවක් තිබුනෙ නෑ..!

පස්වන කොටස

*දඟකාර ළමයෙකු හොඳ ළමයෙකු වූ කතාව......*

සැකසුම : තිළිණ අලහකෝන්




ලබන සතියට